# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2289/07 - 2022 ජූලි මස 18 වැනි සඳුදා - 2022.07.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. සී. එෆ්. 1/64.

**(40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනත**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 40 වන ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවේ (ඇ) ඡේදය සමඟ කියවිය යුතු, (40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ, වැඩබලන ජනාධිපතිවරයා විසින් සාදනු ලබන නියෝග.

**රනිල් වික්‍රමසිංහ,**
*වැඩබලන ජනාධිපති.*
(ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 40(1)(ඇ) ව්‍යවස්ථාව ප්‍රකාරව)

2022 ජූලි මස 18 වන දින,
කොළඹ දී ය.

නියෝග

ලුහුඬු නාමය

1. මේ නියෝග 2022 අංක 1 දරන හදිසි අවස්ථා (විවිධ විධිවිධාන හා බලතල) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

I වන කොටස

**සාමාන්‍ය**

අර්ථ නිරූපණය

2.(1) මේ නියෝගවල "ජනාධිපතිවරයා" යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 40 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඇ) ඡේදය ප්‍රකාරව වැඩබලන ජනාධිපතිවරයා අදහස් වන්නේ ය.

(2) යම් හදිසි අවස්ථා නියෝගයක වෙනත් යම් අර්ථ නිරූපණයක් ප්‍රකාශිතවම එහි සඳහන් කර ඇත්නම් මිස හෝ එය එහි අන්‍යාකාරයකින් ප්‍රකාශිතවම සඳහන් කර ඇත්නම් මිස හෝ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස-

"නීතිපතිවරයා" යන්නට, යම් හදිසි අවස්ථා නියෝගයක් සම්බන්ධයෙන් වන විට, සොලිසිටර් ජනරාල්වරයා, ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්වරයා, අතිරේක සොලිසිටර් ජනරාල්වරයා, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයකු, නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයකු, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥවරයකු, රජයේ අධිනීතිඥවරයකු හෝ, එම නියෝගයේ කාර්යය සඳහා නීතිපතිවරයා විසින් තත්කාර්ය සඳහා බලය පවරනු ලැබූ යම් නීතිඥවරයකු ද ඇතුළත් වේ ;

"සන්නද්ධ හමුදා" යන්නෙන්, පිළිවෙළින් (357 වන අධිකාරය වූ) යුද්ධ හමුදා පනත, (358 වන අධිකාරය වූ) නාවික හමුදා පනත සහ (359 වන අධිකාරය වූ) ගුවන් හමුදා පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා යුද්ධ හමුදාව, ශ්‍රී ලංකා නාවික හමුදාව සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාව අදහස් වේ ;

"නිසි බලධරයා" යන්නෙන්, යම් හදිසි අවස්ථා නියෝගයක් සම්බන්ධයෙන් වන විට, එම නියෝගයේ අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වා ඇත්නම් මිස, එම නියෝගයේ කාර්යය සඳහා නිසි බලධරයකු වශයෙන් ජනාධිපතිවරයා විසින් නමින් හෝ නිලයෙන් පත්කරනු ලැබූ යම් තැනැත්තකු අදහස් වේ ;

"හදිසි අවස්ථා නියෝගය" යන්නෙන්, මේ නියෝග අතුරින් යම් නියෝගයක් හෝ (40 වන අධිකාරය වූ)මහජන ආරක්ෂක ආඥාපනත යටතේ සාදනු ලැබූ වෙනත් යම් නියෝග අදහස් වේ ;

"අත්‍යවශ්‍ය සේවාව" යන්නෙන්, මහජන උපයෝගීතාවයෙන් යුතු වන්නා වූ හෝ ජාතික ආරක්ෂාව සඳහා හෝ මහජන සාමය ආරක්ෂා කිරීම සඳහා හෝ ජන ජීවිතය සඳහා අත්‍යවශ්‍ය වූ යම් සේවාවක් අදහස්වන අතර, ඊට යම් රජයේ දෙපාර්තමේන්තුවක් හෝ එහි ශාඛාවක් ද ඇතුළත් වේ ;

"පොලිස්පතිවරයා" යන්නට, යම් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයකු සහ නියෝජ්‍ය පොලිස්පතිවරයකු ද ඇතුළත්වේ ;

"ඉඩම" යන්නට, ජලයෙන් වැසුනු ඉඩම් ද ගෙවල්වල හෝ ගොඩනැගිලිවල කොටස් ද ඇතුළත් වේ ;

"පොලිස් නිලධරයා" යන්නෙන්, (53 වන අධිකාරය වූ) පොලිස් ආඥාපනත යටතේ පිහිටුවන ලද යම් පොලිස් හමුදාවක සාමාජිකයකු අදහස් වේ ;

"රජයේ නිලධරයා" යන්නට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතුය.

"ශ්‍රී ලංකාව" යන්නට, එහි දේශීය ජලතීරය සහ ගුවන් අවකාශය ද ඇතුළත් වේ

(3) (2 වන අධිකාරය වූ) අර්ථ නිරූපණ ආඥාපනත, යම් පනතක හෝ ආඥාපනතක හෝ ජාතික රාජ්‍ය සභාවේ පනතක හෝ අර්ථ නිරූපණය සඳහා අදාළවන පරිද්දෙන්ම, යම් හදිසි අවස්ථා නියෝගයක් සහ ඒ යටතේ සාදන ලද යම් නියම හෝ රීති අර්ථ නිරූපණය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතුය.

(4) යම් හදිසි අවස්ථා නියෝගයක් සම්බන්ධයෙන් යම් ලේඛනයක හෝ වෙනත් යම් ලිඛිත නීතියක කර ඇති යම් සඳහනක්, ඉන්පටහැනි අදහසක් පෙනෙන්නේ නම් මිස, (40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනත යටතේ සාදනු ලැබූ යම් තදනන්තර නියෝගයකින් සංශෝධිත පරිදි ඒ නියෝගය සම්බන්ධයෙන් කරන ලද සඳහනක්, ලෙස තේරුම්ගත යුතු ය.

(5) යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ කරනු ලැබූ හෝ සාදනු ලැබූ යම් විධානයක හෝ නියමයක කාලසීමාවක් නිශ්චිතව දැක්විය යුතුයයි එම නියෝගයෙන් නියම කර ඇත්තා වූ ද, නැතහොත් එසේ නිශ්චිතව දැක්වීමට එම නියෝගයෙන් ඉඩ සලස්වා ඇත්තා වූ ද එවැනි යම් කාල සීමාවක් එම විධානයෙන් හෝ නියමයෙන් නිශ්චිතව දක්වා නොමැත්තා වූ ද අවස්ථාවක, එම කාලසීමාව, එම විධානය හෝ නියමය හෝ කරනු ලැබූවේ හෝ සාදනු ලැබුවේ යම් නියෝගයක් යටතේ ද එම නියෝගය බලාත්මකව පවතින කාලසීමාව වශයෙන් සැලකිය යුතුය.

හදිසි අවස්ථා බලතල ජනාධිපතිවරයාගේ අනෙකුත් බලතල වලට අමතරව විය යුතු බව

3. අන්‍යාකාරයකින් ප්‍රකාශිතව විධිවිධාන සලස්වා ඇත්නම් මිස, යම් හදිසි අවස්ථා නියෝගයක් මගින් පවරනු ලැබූ බලතල, ජනාධිපතිවරයා වෙත හෝ වෙනත් යම් බලධරයකු හෝ තැනැත්තකු වෙත නීතිය මගින් සතු කරන ලද හෝ පවරනු ලැබූ වෙනත් යම් අයිතිවාසිකම් හෝ බලතලවලට අමතරව වියයුතු අතර එම අයිතිවාසිකම් හෝ බලතල හීනකිරීමක් නොවිය යුතුය.

ජනාධිපතිවරයාගේ බලතල යම් අමාත්‍යවරයකු වෙත පැවරීම

4. යම් හදිසි අවස්ථා නියෝගයක් මගින් ජනාධිපතිවරයා වෙත පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක්, ජනාධිපතිවරයා විසින් තත්කාර්ය සඳහා බලය පවරනු ලැබූ යම්අමාත්‍යවරයකු විසින් ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටුකිරීම හෝ කරනු ලැබිය හැකිය.

නිසි බලධරයා පත් කිරීම

5.(1) ජනාධිපතිවරයා විසින්, යම් හදිසි අවස්ථා නියෝගයක කාර්ය සඳහා යම්තැනැත්තකු නමින් හෝ නිලයෙන් නිසිබලධරයා වශයෙන් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් මුළු ශ්‍රී ලංකාව සඳහා හෝ ඒ තැනැත්තා පත් කරනු ලබන ලියවිල්ලෙහි නිශ්චිතව සඳහන් යම් ප්‍රදේශයක් හෝ ස්ථානයක් සඳහා පත් කරනු ලැබිය හැකි ය. තව ද, ඒ පත් කිරීම ඒ ලියවිල්ලෙහි නිශ්චිතව දක්වා ඇති කාර්යය සඳහා සීමා කරනු ලැබිය හැකිය

එසේ වුව ද, යම් නියෝගයක යම් කාර්ය සඳහා හෝ යම් නිශ්චිතව දක්වා ඇති යම් ප්‍රදේශයක් හෝ ස්ථානයක් සඳහා නිසි බලධරයන් වශයෙන් තැනැත්තන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් පත්කිරීම මේ ඡේදයේ ඉහතින් වූ විධිවිධානවල කිසිවකින් වැළකේ යැයි නොසැලකිය යුතු ය.

(2) යම් නමෝදිෂ්ඨ ධුරයක් දරන්නකු නිසි බලධරයකු ලෙස පත් කරනු ලැබ ඇති අවස්ථාවක, පටහැනි විධිවිධානයක් ප්‍රකාශිතව කර ඇත්නම් මිස, එවකට එකී නමෝදිෂ්ඨ ධුරයෙහි කාර්යය ඉටුකරන තැනැත්තා වෙත ඒ පත් කිරීම දීර්ඝ වන ලෙස සැලකිය යුතු ය.

දැන්වීම් භාරදීම

6. යම් හදිසි අවස්ථා නියෝගයක කාර්යය සඳහා යම් තැනැත්තකු වෙත භාරදිය යුතු දැන්වීමක්, ඒ හදිසි අවස්ථා නියෝගයේ අඩංගු යම් විශේෂ විධිවිධානවලට අගතියක් නොමැතිව, ඒ තැනැත්තාට භාරදීම හෝ ඒ තැනැත්තාගේ අවසානයට දැන සිටි හෝ සිරිත් පරිදි වූ වාසස්ථානය හෝ ව්‍යාපාරික ස්ථානය වෙත තැපැලෙන් යැවීමෙන් භාරදිය හැකිය.

නියමයන් ආදිය ප්‍රත්‍යාදිෂ්ට කිරීම හා වෙනස් කිරීම

7. යම් නියමයක් හෝ රීතියක් සෑදීම සඳහා යම් හදිසි අවස්ථා නියෝගයක් මගින් පවරන ලද යම් බලයකට ඒ නියමය හෝ රීතිය සමාන ආකාරයෙන් සහ සමාන කොන්දේසිවලට යටත්ව ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ වෙනස් කිරීම සඳහා ක්‍රියාත්මක කළ හැකි බලය ද ඇතුළත් වන ලෙස තේරුම් ගත යුතු ය.

## II වන කොටස

### අත්‍යවශ්‍ය සේවා

අත්‍යවශ්‍ය සේවා සම්බන්ධීකරණය කිරීම සඳහා අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා පත් කිරීම

8.(1) ජනාධිපතිවරයා විසින්, නියමයක් මගින්, මුළු ශ්‍රී ලංකාව සඳහාම අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා වශයෙන් යම් තැනැත්තකු නමින් හෝ නිලයෙන් පත් කරනු ලැබිය හැකි ය. අත්‍යවශ්‍ය සේවා සැපයීම සහ පවත්වාගෙන යාමට අදාළ සියලු ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සහ සම්බන්ධීකරණය කිරීම අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයාගේ කාර්යය වන්නේ ය.

(2) අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා විසින්, මේ නියෝග යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි අතිරේක කොමසාරිස්වරයන්, නියෝජ්‍ය කොමසාරිස්වරයන් හෝ සහකාර කොමසාරිස්වරයන් නමින් හෝ නිලයෙන් පත්කරනු ලැබිය හැකිය.

(3) අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා විසින් මේ නියෝග මගින් හෝ මේ නියෝග යටතේ ඔහු වෙත පවරා ඇති හෝ නියම කොට ඇති බලතල, කාර්යය හෝ කර්තව්‍යය (2) වන ඡේදය යටතේ පත් කරනු ලැබූ යම් අතිරේක කොමසාරිස්වරයකු, නියෝජ්‍ය කොමසාරිස්වරයකු හෝ සහකාර කොමසාරිස්වරයකු වෙත පවරනු ලැබිය හැකිය.

(4) මේ නියෝග යටතේ වන කාර්යය ඉටු කිරීම සඳහා, අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා විසින්, මේ නියෝග යටතේ යම් බලයක් පවරා ඇත්තේ යම් බලධරයකු හෝ නිලධරයකු වෙත ද, එම බලධරයා හෝ නිලධරයා වෙත පවරන ලද යම් බලයක් අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(5) අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා විසින්-

(අ) මේ නියෝග යටතේ යම් බලයක් පවරා ඇත්තේ යම් බලධරයකු හෝ නිලධරයකු වෙත ද, එම බලධරයා හෝ නිලධරයා ; සහ

(ආ) 40 වන නියෝගය යටතේ පත් කරන ලද යම් සම්බන්ධීකරණ නිලධරයකු,

වෙත, අත්‍යාවශ්‍ය සේවා පවත්වාගෙන යන බවට වගබලා ගැනීම සඳහා අවශ්‍ය විය හැකි යම් විධාන ලබා දෙනු ලැබිය හැකි අතර, එවැනි සෑම විධානයකටම අනුකූලව කටයුතු කිරීම, අවස්ථාවෝචිත පරිදි, එකී බලධරයාගේ, නිලධරයාගේ හෝ සම්බන්ධීකරණ නිලධරයාගේ කාර්යය විය යුතු ය.

අත්‍යවශ්‍ය සේවා

9. (1) මහජන සාමය පවත්වාගෙන යාම සහ සුරක්ෂිත කිරීම සඳහා සහ ජන ජීවිතයට අත්‍යවශ්‍ය සැපයුම් සහ සේවා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය යයි පෙනී යන්නේ නම්, ජනාධිපතිවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් යම් සේවාවක් අත්‍යවශ්‍ය සේවාවක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය.

(2) (අ) එකී නියමයේ දින සිට එක් දිනක් ඉකුත් වීමෙන් පසු, නීත්‍යානුකූල හේතුවකින් තොරව, ස්වකීය සේවා හෝ රැකියා ස්ථානයට හෝ ස්වකීය සේවායෝජකයා විසින් හෝ ස්වකීය සේවායෝජකයාගේ අධිකාරිය යටතේ ක්‍රියා කරන තැනැත්තකු විසින්, කලින් කල, නම් කරනු ලබන වෙනත් යම් ස්ථානයකට පැමිණීම පැහැර හරින්නා වූ නැතහොත් ප්‍රතික්ෂේප කරන්නා වූ; හෝ

(ආ) නීත්‍යානුකූල හේතුවකින් තොරව සේවයේ යෙදීම පැහැර හරින්නා වූ නැතහොත් ප්‍රතික්ෂේප කරන්නා වූ හෝ එකී සේවාවට අදාළ ස්වකීය සේවා නියුක්තියේ නියම සහ කොන්දේසිවලට අනුකූලව ඔහු විසින් සේවයේ යෙදිය යුතු සම්පූර්ණ කාලසීමාව තුළ හෝ සාමාන්‍ය සේවා දිනයේ යම් කොටසක් තුළ සේවයේ යෙදීමෙන් තොරව, සේවයේ යෙදීම මග හරින්නා වූ ; හෝ

(ඇ) එකී නියමයේ දින සිට එක් දිනක් ඉකුත්වීමෙන් පසු, නීත්‍යානුකූල හේතුවකින් තොරව, ස්වකීය සේවායෝජකයා හෝ ස්වකීය සේවායෝජකයාගේ අධිකාරිය යටතේ ක්‍රියා කරන තැනැත්තකු විසින් කරන ලෙස ඔහුට විධාන කරනු ලැබිය හැකි යම් කාර්යයක් කිරීම පැහැර හරින්නා වූ නැතහොත් ප්‍රතික්ෂේප කරන්නා වූ ; හෝ

( ඈ) ඔහු විසින් වැඩ වර්ජනයකට හෝ වෙනත් සංවිධානාත්මක ක්‍රියාවකට ආධාර දීම සඳහා එසේ පැමිණීම හෝ එසේ සේවයේ යෙදීම පැහැර හැර නැතහොත් ප්‍රතික්ෂේප කර ඇති වුව ද, එය නොතකා නිශ්චිත සේවාවක යෙදී සිටින හෝ සේවයේ නියුක්ත තැනැත්තකු වෙමින්, නීත්‍යානුකූල හේතුවකින් තොරව, ස්වකීය සේවායෝජකයා විසින් හෝ ස්වකීය සේවායෝජකයාගේ අධිකාරිය යටතේ ක්‍රියා කරන තැනැත්තකු විසින් කරන ලෙස, කලින් කල, ඔහුට විධාන කරනු ලැබිය හැකි යම් කාර්යයක් (එකී වේලාව හෝ ස්ථානය හෝ කාලසීමාව සාමාන්‍ය සේවා හෝරාවක් ඇතුළත වුව ද, පිටත වුව ද, නැතහොත් නිවාඩු දිනවල දී වුව ද) එකී කාර්යය කිරීම සඳහා එකී සේවායෝජකයා හෝ තැනැත්තා විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් වේලාවක දී හෝ ස්ථානයක දී හෝ යම් කාලසීමාවක් තුළ දී කිරීම පැහැර හරින්නා වූ හෝ ප්‍රතික්ෂේප කරන්නා වූ,

(1) වන ඡේදය ප්‍රකාර ජනාධිපතිවරයා විසින් අත්‍යාවශ්‍ය සේවාවක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබූ සේවාවක් හා සම්බන්ධ යම් කාර්යයක යෙදී සිටින හෝ සේවයේ නියුක්ත වන යම් තැනැත්තකු, වෙනත් යම් නීතියක හෝ ස්වකීය සේවා නියුක්තිය පාලනය වන යම් ගිවිසුමක නියම හෝ කොන්දේසිවල පටහැනිව කුමක් සඳහන් වුව ද, එය නොතකා, සියලු කාර්ය සඳහා වහාම ස්වකීය සේවා නියුක්තිය අවසන් කළ ලෙස හෝ අත්හරිනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඊට අමතරව, වරදකට වරදකරු විය යුතු ය.

(3) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ජනාධිපතිවරයා විසින් යම් සේවාවක් අත්‍යවශ්‍ය සේවාවක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබූ අවස්ථාවක-

(අ) කවර හෝ ආකාරයකින්-

(i) ඒ සේවාව කරගෙන යාමට අවහිර කරන, බාධා කරන, ප්‍රමාද කරන හෝ පරිසීමා කරන ; හෝ

(ii) ඒ සේවාව කරගෙන යාමෙහි හෝ ඒ හා සම්බන්ධයෙන් සේවයේ නියුක්ත වන වෙනත් යම් තැනැත්තන්ට ස්වකීය සේවා ස්ථානයට පැමිණීමෙන් වැළකීම සඳහා අවහිර කරන, බාධා කරන, ප්‍රමාද කරන හෝ වළක්වන ; හෝ

(iii) ඒ සේවාව කරගෙන යාමෙහි හෝ ඒ හා සම්බන්ධයෙන් සේවයේ නියුක්ත වන වෙනත් යම් තැනැත්තකුට ස්වකීය සේවා ස්ථානයට පැමිණීමෙන් වැළකීම සඳහා පොළඹවන, ප්‍රේරණය කරන හෝ දිරිගන්වන ; හෝ

(iv) රජයේ දෙපාර්තමේන්තුවක් හෝ එහි ශාඛාවක් වන, ඒ සේවාව වෙනුවට වූ නැතහොත් ඊට සමාන්තර වූ වෙනත් යම් සේවාවක් පිහිටුවීමට හෝ පවත්වාගෙන යාමට බලකරන, පොළඹවන, ප්‍රේරණය කරන හෝ දිරි ගන්වන ; හෝ

(v) ඒ සේවාව කරගෙන යාමෙහි හෝ ඒ හා සම්බන්ධයෙන් සේවයේ නියුක්ත වන වෙනත් යම් තැනැත්තකුට (එහි ප්‍රතිඵලයක් ලෙස එකී වෙනත් තැනැත්තා විසින් ස්වකීය රැකියාව අත්හැර දැමීම හෝ ඉන් ඉවත් වීම සිදු කරනු ලැබුව ද නොලැබුව ද) එසේ ස්වකීය රැකියාව අත්හැර දැමීමට හෝ ස්වකීය රැකියාවෙන් ඉවත්වීමට බල කරන, පොළඹවන, ප්‍රේරණය කරන හෝ දිරිගන්වන ; හෝ

(vi) වෙනත් යම් තැනැත්තකු විසින් ඒ සේවාව කරගෙන යාම සඳහා හෝ ඒ සම්බන්ධයෙන් වන රැකියාවකට අවස්ථාවක් ලබා දීම හෝ රැකියාවක් භාරගැනීම වළක්වන,

යම් තැනැත්තකු ;

(ආ) (එහි ප්‍රතිඵලයක් ලෙස නිශ්චිතව දක්වන ලද යම් ක්‍රියාවක් එම වෙනත් තැනැත්තා විසින් සිදු කරනු ලැබුව ද නොලැබුව ද) මේ ඡේදයේ (අ) අනු ඡේදයේ නිශ්චිතව දක්වා ඇති යම් ක්‍රියාවක් සිදු කිරීම සඳහා, යම් භෞතික ක්‍රියාවක් මගින් හෝ යම් භාෂණයක් හෝ ලියවිල්ලක් මගින් වෙනත් යම් තැනැත්තකු පොළඹවන, ප්‍රේරණය කරන හෝ දිරිගන්වන යම් තැනැත්තකු,

වරදක් කරනු ලබන අතර, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට, වසර තුනක් නොඉක්මවන කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු ය.

(4) (2) වන ඡේදයේ විධිවිධාන ක්‍රියාත්මක වීම හේතුවෙන් ස්වකීය රැකියාව අවසන් කළ ලෙස හෝ අත්හැර ගිය ලෙස සලකනු ලබන යම් තැනැත්තකු විසින් එකී අවසන් කිරීමෙන් හෝ අත්හැර යාමෙන් දින තුනක් ඇතුළත, රජය විසින් හෝ රජය වෙනුවෙන් ඔහුට ලබා දී ඇති යම් නිල නිවාසයක් අත්හැර යනු ලැබිය යුතු ය. එකී කාලසීමාව ඇතුළත එකී නිලනිවාසය අත්හැර යාම පැහැර හරින්නා වූ යම් තැනැත්තකු විසින් මේ නියෝග යටතේ වරදක් කරනු ලබන්නේ ය.

(5) යම් මහධිකරණයක් විසින් මේ නියෝගය යටතේ වන යම් වරදකට යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ අවස්ථාවක, එම වරද සඳහා මහාධිකරණය විසින් නියම කරනු ලබන වෙනත් යම් දණ්ඩනයකට අමතරව-

(අ) එම වරදකරු කරනු ලැබීම ප්‍රකාරව, ඒ තැනැත්තාගේ සියලු චංචල හෝ නිශ්චල දේපළ ජනරජය සන්තක වූ ලෙස සලකනු ලැබිය යුතු ය ; සහ

(ආ) මේ නියෝග බලාත්මක වන දිනෙන් පසු එකී තැනැත්තා විසින් සිදු කරන ලද එකී දේපළ අන්සතු කිරීමක් හෝ වෙනත් බැහැර කිරීමක් ශූන්‍ය සහ බලරහිත වන ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ජනාධිපතිවරයා විසින් යම් සේවාවක් අත්‍යාවශ්‍ය සේවාවක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබූ අවස්ථාවක, අවශ්‍ය යයි සලකනු ලබන කවර හෝ විටක දී, අදාළ විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විමසා, ආරක්ෂක විෂයය පැවරී ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ තත්කාර්ය සඳහා ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකු විසින් එවැනි යම් සේවාවක සේවයේ නියුක්ත වන හෝ ඊට අයත් වන යම් නිලධරයකුගේ, සේවකයකුගේ, සේවා නියුක්තයකුගේ හෝ අනුයෝජිතයකුගේ සේවයක් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

(7) මේ නියෝගයේ-

"නිල නිවාසය" යන්නෙන්, පදිංචිය සඳහා යොදා ගනු ලබන හෝ භාවිත කරනු ලබන යම් ගොඩනැගිල්ලක් හෝ කාමරයක් හෝ වෙනත් නවාතැනක් අදහස් වන අතර, ඊට එකී ගොඩනැගිල්ල, කාමරය හෝ වෙනත් නවාතැන පිහිටි යම් ඉඩමක් හෝ පරිශ්‍රයක් ද ඇතුළත් වේ ; සහ

"නිශ්චිත සේවාව" යන්නෙන්, එකී සේවාව හා සම්බන්ධ යම් කාර්යයක සේවයේ නියුක්ත වන හෝ යෙදී සිටින තැනැත්තකු විසින් සාමාන්‍ය සේවා හෝරාවලින් පිටත දී හෝ නිවාඩු දිනවල දී සේවයේ යෙදීමට අවශ්‍ය කරන්නා වූ අත්‍යාවශ්‍ය සේවාවක් වන, (1) වන ඡේදය යටතේ ජනාධිපතිවරයා විසින් නිශ්චිත සේවාවක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලබන යම් අත්‍යාවශ්‍ය සේවාවක් අදහස් වේ.

## III වන කොටස

### ඇතුළුවීමේ අයිතිවාසිකම

අනවසර ඇතුළුවීම වැළැක්වීම

10. (1) මේ නියෝගවල කාර්යය සඳහා, යම් අත්‍යාවශ්‍ය සේවාවක් සම්බන්ධයෙන්, ජනාධිපතිවරයා විසින් නමින් හෝ නිලයෙන් නිසි බලධරයකු පත් කළ හැකි ය.

(2) සම්පූර්ණයෙන්ම හෝ ප්‍රධාන වශයෙන් අත්‍යාවශ්‍ය සේවා පවත්වාගෙන යාම සඳහා යොදා ගනු ලබන හෝ භාවිත කරනු ලබන යම් ප්‍රදේශයකට, ස්ථානයකට හෝ පරිශ්‍රයකට අවසර නොලත් තැනැත්තන් ඇතුළුවීම වැළැක්වීම සඳහා විශේෂ පූර්වාරක්ෂක පියවර ගත යුතු බව නිසි බලධරයකුගේ මතය වන අවස්ථාවක, ඒ නිසි බලධරයා විසින්, නියමයක් මගින්, ඒ නියමයේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් නිදහස් කිරීම්වලට යටත්ව, කිසිම තැනැත්තකු විසින් එම බලධරයාගේ හෝ ඒ නියමයේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි තැනැත්තකුගේ අවසරයෙන් තොරව ඒ ප්‍රදේශයට හෝ ස්ථානයට හෝ පරිශ්‍රයට ඇතුළුවීම හෝ එහි රැඳී සිටීම නොකළ යුතු යයි විධාන කරනු ලැබිය හැකි ය.

(3) මේ නියෝගය යටතේ සාදනු ලැබූ යම් නියමයක් උල්ලංඝනය කරමින් යම් තැනැත්තකු යම් ප්‍රදේශයක, ස්ථානයක හෝ පරිශ්‍රයක සිටියහොත්, ඔහුට විරුද්ධව පවරනු ලැබිය හැකි වෙනත් යම් නීති කෘත්‍යයකට අගතියක් නොවන පරිදි, යම් පොලිස් නිලධරයකු හෝ සන්නද්ධ හමුදා සාමාජිකයකු හෝ තත්කාර්ය සඳහා නිසි බලධරයකු විසින් බලය පවරනු ලැබූ වෙනත් යම් තැනැත්තකු විසින් ඔහුව එම ස්ථානයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

## IV වන කොටස

### සෝදිසි කිරීම සහ අත් අඩංගුවට ගැනීම

වැරදි සඳහා සෝදිසි කිරීම සහ අත්අඩංගුවට ගැනීම

11. (1) යම් පොලිස් නිලධරයකු හෝ යම් සන්නද්ධ හමුදා සාමාජිකයකු විසින්, මේ නියෝගවලින් යම් නියෝගයක් යටතේ වන වරදක් හෝ (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ (345, 354, 355, 356, 357, 358, 359, 360, 360අ, 360ආ, 360ඇ යන වගන්ති සහ 364, 365, 365අ, 365ආ යන වගන්ති සහ 427 සිට 446 දක්වා වන වගන්ති ප්‍රකාර යම් වරදක් කරන්නා වූ හෝ කරනු ලැබ ඇති හෝ වරදක් හා සම්බන්ධ බවට හෝ වරදක් කරනු ලැබූ බවට සැක කරනු ලැබීමට යුක්ති සහගත හේතු ඇත්තා වූ හෝ යම් තැනැත්තකු සෝදිසි කිරීම, එසේ සෝදිසි කිරීමේ කාර්ය සඳහා රඳවා තබා ගැනීම, හෝ වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගැනීම කළ හැකි වන අතර, තව ද, වරද සිදු කිරීමේ දී භාවිත කරන ලද හෝ වරද සිදු කිරීම හා සම්බන්ධ යම් වාහනයක්, යාත්‍රාවක්, භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ කවරාකාර හෝ දෙයක් සෝදිසි කිරීම, තහනමට ගැනීම, ඉවත් කිරීම සහ රඳවා තබා ගැනීම කළ හැකි ය.

(2) (1) වන ඡේදය යටතේ සන්නද්ධ හමුදා සාමාජිකයකු විසින් සිරභාරයට ගනු ලැබූ යම් තැනැත්තකු, පැය විසිහතරක් ඇතුළත, ළඟම පිහිටි පොලිස් ස්ථානය වෙත භාර දෙනු ලැබිය යුතු ය.

(3) පොලිස් නිලධරයකු විසින් සිරභාරයට ගනු ලැබූ යම් තැනැත්තකු ළඟම පිහිටි පොලිස් ස්ථානය වෙත ගෙන යනු ලැබිය යුතු ය.

(4)(1) වන ඡේදය යටතේ සෝදිසියක් පවත්වන යම් තැනැත්තකු විසින් සෝදිසි කරනු ලැබූ පරිශ්‍රයෙහි, ස්ථානයෙහි, වාහනයෙහි හෝ යාත්‍රාවෙහි සිටින වෙනත් යම් තැනැත්තකුගෙන් හෝ සෝදිසි කරනු ලැබූ තැනැත්තාගෙන් සෝදිසි කිරීමේ කාර්යය හා සම්බන්ධ හෝ එයට අදාළ වූ හෝ යම් කාරණයක් සම්බන්ධයෙන් ප්‍රශ්න කළ හැකි ය.

(5) මේ නියෝගයේ (4) වන ඡේදය යටතේ ප්‍රශ්න කරනු ලැබූ සෑම තැනැත්තකු විසින්ම එම තැනැත්තාගෙන් ප්‍රශ්න කරනු ලැබූ කාරණය සම්බන්ධයෙන් එම තැනැත්තා දන්නා යම් තොරතුරක් සැපයිය යුතු ය.

(6) මේ නියෝගය යටතේ සෝදිසි කළ යුතු යම් පරිශ්‍රයක, ස්ථානයක, වාහනයක හෝ යාත්‍රාවක පදිංචිව සිටින හෝ එබන්දක් භාරව සිටින තැනැත්තා විසින්, සෝදිසිය පවත්වන තැනැත්තාගේ ඉල්ලීම මත, ඔහුට ඊට ඇතුළුවීමට අවසර දිය යුතු අතර, එහි සෝදිසියක් කිරීම සඳහා සියලු යුක්ති සහගත පහසුකම් ඔහුට සැලසිය යුතුය.

(7) මේ නියෝගය යටතේ සෝදිසියක් පවත්වන තැනැත්තකු විසින් සෝදිසි කළයුතු පරිශ්‍රය, ස්ථානය, වාහනය හෝ යාත්‍රාව වෙත ඇතුළුවීම සඳහා යම් බාහිර හෝ අභ්‍යන්තර දොරක් හෝ ජනේලයක් විවෘත කිරීම හෝ කඩා විවෘත කිරීම සිදු කළ හැකිය.

(8) ස්ත්‍රියක සෝදිසි කිරීමට අවශ්‍ය වූ අවස්ථාවක සෝදිසිය වෙනත් ස්ත්‍රියක විසින් කරනු ලැබිය යුතු ය.

(9) සිරභාරයට ගැනීමේ නිලධරයා පොලිස් නිලධරයකු වන අවස්ථාවක, සිර භාරයට ගැනීම කරනු ලැබුවේ යම් ප්‍රදේශයක් තුළ ද, ඒ ප්‍රදේශයේ පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා වෙතද, සිරභාරයට ගැනීමේ නිලධරයා සන්නද්ධ හමුදා සාමාජිකයකු වන අවස්ථාවක, සිරභාරයට ගැනීම කරනු ලැබුවේ යම් ප්‍රදේශයක් තුළ ද ඒ ප්‍රදේශයේ අණදෙන නිලධරයා වෙතද, එසේ සිරභාරයට ගැනීමෙන් පැය විසිහතරක් ඇතුළත (1) වන ඡේදය යටතේ කරන ලද සිරභාරයට ගැනීම පිළිබඳව වාර්තා කිරීම, යම් තැනැත්තකු සිරභාරයට ගැනීම සිදු කළ සිරභාරයට ගැනීමේ නිලධරයගේ කාර්යය විය යුතු ය.

(10) මේ නියෝගයේ විධිවිධාන යටතේ යම් දේපළක්ත හනමට ගනු ලැබුවාවූ හෝ රඳවා තබාගනු ලැබුවාවූ අවස්ථාවක, තහනමට ගැනීම හෝ රඳවා තබාගැනීම ක්‍රියාත්මක කරන තැනැත්තා විසින්, ඒ දේපළ තහනමට ගනු ලැබුවේ හෝ රඳවා තබාගනු ලැබුවේ යම් තැනැත්තකුගේ භාරයෙන් ද, ඒ දේපළ සම්බන්ධයෙන් වූ ලදුපතක් ඒ තැනැත්තා වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

(11) ජනාධිපතිවරයා විසින්, කලින් කල, නියමයක් මගින්, ඒ නියමයේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා ද යම් නිදහස් කිරීම්වලට යටත්ව ද, ශ්‍රී ලංකාවේ යම් ප්‍රදේශයක් තුළ ඒ නියමයේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි මහජන පෙළපාලි හෝ මහජන රැස්වීම් පැවැත්වීම තහනම් කරනු ලැබිය හැකි ය.

(12) පොලිස්පතිවරයා විසින්, ශ්‍රී ලංකාවේ යම් ප්‍රදේශයක් සම්බන්ධයෙන්, නියමයක් මගින්, එම නියමයේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් නිදහස් කිරීම්වලට යටත්ව, ඒ ප්‍රදේශයේ සිටින කිසිදු තැනැත්තකු විසින් පොලිස් ස්ථානාධිපතිවරයකු විසින් ප්‍රදානය කරන ලද ලිඛිත අවසර පත්‍රයක අධිකාරිය යටතේ මිස, එම නියමයේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් හෝරාවන් අතර හෝ යම් කාලසීමාවක් තුළ යම් පොදු මාර්ගයක, දුම්රිය මාර්ගයක, උද්‍යානයක, ක්‍රීඩා භූමියක හෝ වෙනත් යම් පොදු ස්ථානයක රැඳී නොසිටිය යුතු යයි විධාන කරනු ලැබිය හැකි ය.

## V වන කොටස

### වැරදි හා දණ්ඩන

වැරදි

12. (1) (අ) චංචල හෝ නිශ්චල දේපළකට විනාශයක් හෝ හානියක් සිදු කරන හෝ එබඳු යම් දේපළක වටිනාකම හෝ ප්‍රයෝජනය නැති කරන හෝ අඩුකරන අන්දමේ යම් වෙනසක් ඇති කරන යම් ක්‍රියාවක් කරන; හෝ

(ආ) යම් තැනැත්තකු මරණයට පත් කිරීමට හෝ තුවාල සිදු කිරීමට කටයුතු කරන හෝ තැත් කරන; හෝ

(ඇ) වෙනත් යම් තැනැත්තකුට සාපරාධී තැතිගැන්වීම හෝ අඩන්තේට්ටම් කිරීම සිදු කරන; හෝ

(ඈ) පදිංචිය හිස්කොට තිබෙන හෝ අනාරක්ෂිතව ඇති හෝ අලාභහානි සිදු කොට ඇති හෝ විනාශයට පත් කොට ඇති යම් පරිශ්‍රයකින් යම් භාණ්ඩයක් සොරකම් කරන; හෝ

(ඉ) (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 345, 354, 355, 356, 357, 358, 359, 360, 360අ, 360ආ, 360ඇ, 364, 365, 365අ, 365ආ වගන්ති යටතේ යම් වරදක් සිදු කරන; හෝ

(ඊ) යම් දේපළක සොරකම, ත්‍රාසාද්ග්‍රහණයක් හෝ කොල්ලකෑම සිදු කරන; හෝ

(උ) (19 වන අධිකාරය වූ) දණ්ඩනීති සංග්‍රහයේ 408 සිට 426 දක්වා වූ වගන්ති යටතේ යම් වරදක් සිදුකරන ; හෝ

(ඌ) (19 වන අධිකාරය වූ) දණ්ඩනීති සංග්‍රහයේ 427 සිට 446 දක්වා වූ වගන්තිවලින් කවර හෝ වගන්තියක් යටතේ යම් වරදක් සිදු කරන හෝ එවැනි යම් පරිශ්‍රයකින් යම් බඩු බාහිරාදිය හෝ ද්‍රව්‍ය නීති විරෝධී ලෙස ඉවත් කරන හෝ ඉවත් කිරීමට තැත් කරන; හෝ

(එ) (අ), (ආ), (ඇ), (ඈ), (ඉ), (ඊ), (උ) හෝ (ඌ) අනුඡේදයෙහි හෝ දක්වා ඇති යම් ක්‍රියාවක් කිරීම පරමාර්ථ කොට ගත්තාවූ ද (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයෙහි 138 වන වගන්තියෙහි අර්ථ දක්වා ඇති පරිදි වූ ද නීති විරෝධී රැස්වීමක සාමාජිකයකු වන හෝ

(ඒ) මේ ඡේදයෙහි (අ), (ආ), (ඇ), (ඈ), (ඉ), (ඊ), (උ), (ඌ) හෝ (එ) අනුඡේදය යටතේ කරන ලද එම සමාන ක්‍රියා සංයුක්ත වන (19 වන අධිකාරය වූ)දණ්ඩනීති සංග්‍රහය යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ යම් වරදක් කරනු ලබන,

යම් තැනැත්තකු වරදක් කරනු ලබන අතර, (19 වන අධිකාරය වූ) දණ්ඩනීති සංග්‍රහයේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ මේ නියෝගවල කුමක් සඳහන් වුවද, ඒ සඳහා මහාධිකරණය ඉදිරියේ වරදකරු කරනු ලැබූ විට, ජීවිතාන්තය දක්වා බන්ධනාගාරගත කිරීමකට හෝ වසර විස්සක කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ යටත්විය යුතුය.

(2) දේපළ සම්බන්ධ පෞද්ගලික ආරක්ෂාව පිළිබඳ අයිතියට අදාළ වන්නා වූ සහ එකී අයිතිය ක්‍රියාත්මක කිරීමේ දී වරදකරුට මරණය හෝ වෙනත් හානියක් කිරීමට විධිවිධාන සැලසෙන අවස්ථා නියම කරන්නා වූ, (19 වන අධිකාරය වූ)දණ්ඩ නීති සංග්‍රහයේ 96 වන වගන්තිය, ඒ වගන්තියේ අවසානයට පහත දැක්වෙන කොටස එකතු කරනු ලැබූ ලෙස බලපැවැත්විය යුතු ය:-

"පස්වනුව - 2022 අංක 1 දරන හදිසි අවස්ථා (විවිධ විධිවිධාන හා බලතල) නියෝගවල 12 වන නියෝගය යටතේ යම් වරදක්.".

(3) (අ) වරද සිදු කරන අවස්ථාවේ දී හෝ ඒ ආසන්න වේලාවක දී හෝ පැවති සිවිල් කැළඹීමක් සඳහා හෝ වර්ගවාදී අභිප්‍රේරික කැරලි සඳහා ආධාර කිරීමේ දී හෝ ඒ සම්බන්ධයෙන් හෝ එවැන්නක් අතරතුර දී හෝ වරද සිදු කරන ලදැයි නීතිපතිවරයා සෑහීමකට පත් වන්නේ නම්, නීතිපතිවරයා විසින්, ඒ වරද සම්බන්ධයෙන් මේ හදිසි අවස්ථා නියෝගය යටතේ යම් වරදක් සම්බන්ධයෙන් අධිචෝදනාවක් ඉදිරිපත් කරනු ලැබිය හැකිය:

එසේ වුවද, යම් වරදක් කිරීමට අදළ අවස්ථානුගත කරුණු සැලකීමෙන් පසුව නීතිපතිවරයා විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් වරදක් හෝ වැරදි වර්ග සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු කටයුතු ආරම්භ කිරීමට ඔහු විසින් පොලිස්පතිවරයාට බලය පවරනු ලැබිය හැකි අතර, ඉන් අනතුරුව එම නඩු කටයුතු පොලිස්පතිවරයාගේ ලිඛිත අවසරය ඇතිව ආරම්භ කරනු ලැබිය හැකි අතර, එම වැරදි සම්බන්ධයෙන් නඩු විභාගයට අදාළව 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XVII වන පරිච්ඡේදයේ විධිවිධාන, අවශ්‍ය වෙනස්කිරීම් සහිතව, අදාළ විය යුතුය.

(ආ) මහෙස්ත්‍රාත් අධිකරණයක නඩු පවරනු ලැබ ඇති අවස්ථාවක, මේ නියෝගවල 24 වන නියෝගයේ විධිවිධාන සලසා ඇති දඬුවමින් එම වරද සඳහා දඬුවම් කරනු ලැබිය යුතුය.

අසහනකාරී බව වැළැක්වීම

13. කිසිදු තැනැත්තකු විසින්–

(අ) (i) රජයේ නිලධරයන් වන; හෝ

(ii) ජනරජයේ සේවයේ යෙදී සිටින; හෝ

(iii) අත්‍යවශ්‍ය සේවාවන් ඉටු කිරීමේ යෙදී සිටින, තැනැත්තන් අතර අසහනකාරී බව ඇති කිරීමට ප්‍රයත්න දැරීම; හෝ

(ආ) රජයේ නිලධරයකු ලෙස ස්වකීය කාර්යය උල්ලංඝනය වන නැතහොත් ඉහත කී තැනැත්තකු ලෙස එවැනි උල්ලංඝනය කිරීමක් සංස්ථාපනය වන යම් දෙයක් කිරීම හෝ නොකර හැරීම සඳහා (අ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු ප්‍රේරණය කිරීමට ප්‍රයත්න දැරීම,කරනු නොලැබිය යුතු ය.

පත්‍රිකා ආදිය බෙදා හැරීම

14. මහජන ආරක්ෂාවට, මහජන සාමයට හෝ ජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය සැපයීම් හා සේවා පවත්වාගෙන යාමට හෝ අගතිගාමීවන කරුණු අඩංගු යම් දැන්වීම් කොළ, අත්පත්‍රිකා හෝ පත්‍රිකා මහජනයාට පෙනෙන යම් ස්ථානයක ඇලවීම හෝ මහජනයා අතර බෙදාහැරීම හෝ කිසිම තැනැත්තකු විසින් කරනු නොලැබිය යුතුය.

කටකතා හෝ අසත්‍ය ප්‍රකාශ සන්නිවේදනය කිරීම හෝ පැතිරවීම

15. මහජනයා බියවැද්දවිය හැකි හෝ මහජනයා කැළඹිය හැකි හෝ වාර්ගික ප්‍රචණ්ඩත්වයට හේතු විය හැකි හෝ වරදක් සිදු කිරීමට පෙළඹවිය හැකි කිසිදු කටකථාවක් හෝ අසත්‍ය ප්‍රකාශයක් හෝ යම් තොරතුරක් හෝ පින්තූරයක් හෝ පණිවුඩයක් කට වචනයෙන් හෝ ඩිජිටල් ක්‍රමයකින් හෝ සමාජ මාධ්‍ය ඇතුළු වෙනත් කවර වූ හෝ ක්‍රමයකින් සන්නිවේදනය කිරීම හෝ පැතිරවීම කිසිදු තැනැත්තකු විසින් නොකළ යුතුය.

අසත්‍ය ප්‍රකාශ

16. යම් තැනැත්තකු -

(අ) යම් හදිසි අවස්ථා නියෝගයක් ප්‍රකාර හෝ එවැනි යම් නියෝගයක් යටතේ කරනු ලැබූ යම් නියමයක් ප්‍රකාර හෝ කරනු ලැබූ ඉල්ලීමකට පිළිතුරු වශයෙන් සැලකිය යුතු කරුණක් සම්බන්ධයෙන් අසත්‍යබව තමා දන්නා වූ හෝ අසත්‍ය බව විශ්වාස කිරීමට යුක්ති සහගත හේතු ඇත්තාවූ යම් ප්‍රකාශයක් කළහොත් හෝ එබඳු යම් තොරතුරක් සැපයුවහොත්; නැතහොත්;

(ආ) යම් හදිසි අවස්ථා නියෝගයකින් හෝ යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ කරනු ලැබූ නියමයකින් ඔහු විසින් පිළියෙළ කළ යුතු යයි නියම කරනු ලැබූ යම් ගිණුමක, ප්‍රකාශයක, තක්සේරුවක, වාර්තාවක හෝ වෙනත් ලේඛනයක ඉහත සඳහන් පරිදි ප්‍රකාශයක් කළහොත්,

ඒ තැනැත්තා වරදක් සිදු කරන්නේ ය.

විමර්ශනය සිදු කිරීමේ කාර්යය සඳහා රඳවා තබා ගැනීම

17. (1) මේ නියෝග ප්‍රකාර සිරභාරයට ගන්නා ලද යම් තැනැත්තකු නියෝජ්‍ය පොලිස්පතිවරයකු විසින් නිකුත් කරන ලද නියමයක් ප්‍රකාරව, විමර්ශන සිදු කිරීමේ කාර්යය සඳහා රඳවා තබා ගනු ලැබිය හැකි ය. එකී තැනැත්තා එකී නියමයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව දින දහහතරක් නොඉක්මවන කාලසීමාවක් සඳහා රඳවා තබා ගනු ලැබිය යුතු ය.

(2) ඉහත නියෝග ප්‍රකාර සිරභාරයට ගන්නා ලද යම් තැනැත්තකු හැකිතාක් ඉක්මනින් පොලිස් ස්ථානයක් වෙත රැගෙන යා යුතු අතර, එම නියෝග ප්‍රකාර නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් එම තැනැත්තා රඳවා ගැනීම සඳහා නියමයක් කර ඇත්නම් මිස, පැය හැත්තදෙකක් නොඉක්මවන කාලසීමාවක් ඔහු එහි රඳවා තබා ගෙන මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) මේ නියෝග යටතේ රිමාන්ඩ් භාරයට පත් කරන ලද හෝ රඳවා තබා ගන්නා ලද තැනැත්තකුට ඔහුගේ ඥාතීන් සමඟ සන්නිවේදනය කිරීමට අයිතිවාසිකම තිබිය යුතු ය.

(4) මේ නියෝග යටතේ රඳවා තබා ගන්නා ලද තැනැත්තකු නියෝජනය කරන යම් නීතිඥවරයකුට, එම තැනැත්තා රඳවා තබාගැනීමට නියම කරන ලද නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් නිශ්චය කරනු ලබන කොන්දේසිවලට යටත්ව, එම තැනැත්තා වෙත ප්‍රවේශවීමේ හා ඔහු වෙනුවෙන් කරුණු ඉදිරිපත් කිරීමේ අයිතිවාසිකම තිබිය යුතු ය.

බිය ගැන්වීම වැළැක්වීම

18. (1) වෙනත් යම් තැනැත්තකු වාසය කරන හෝ වැඩ කරන හෝ ව්‍යාපාර කටයුතු කරගෙන යන හෝ සිටින ගෙයක නැතහොත් ස්ථානයක සිටින්නාවූ යම් තැනැත්තකු බියගන්වන ආකාරයෙන් හෝ ඒ ගෙයට නැතහොත් ස්ථානයට ඇතුළුවීම හෝ ඉන් පිටවීම අවහිර කෙරෙන ආකාරයෙන් හෝ සාමය කඩවීමට තුඩුදෙන ආකාරයෙන් ඒ ගෙයට නැතහොත් ස්ථානයට හෝ ඒ අසළට කිසිදු තැනැත්තකු නොයා යුතුය.

(2) මේ නියෝගයේ-

"බිය ගැන්වීම" යන්නෙන්, තමාට හෝ තම පවුලේ යම් සාමාජිකයකුට හෝ තමාගෙන් යැපෙන යම් තැනැත්තකුට හෝ හානියක් සිදුවෙයියි හෝ යම් තැනැත්තකුට හෝ දේපළකට යම් හිංසාවක් හෝ හානියක් සිදුවේ යයි සාධාරණ හැඟීමක් යම් තැනැත්තකුගේ සිතෙහි ජනිතකරවීම අදහස්වේ; සහ

"හානිය"යන යෙදුමට යම් තැනැත්තකුට, ඔහුගේ ව්‍යාපාරයට, වෘත්තීයට, සේවා නියුක්තියට හෝ වෙනත් ආදායම් මාර්ගයකට සාවද්‍ය ක්‍රියාවක් මගින් සිදුකරන යම් හානියක් හෝ අලාභයක් ඇතුළත්වේ.

බලය දරන තැනැත්තන්ට විරෝධය පෑම හෝ අවහිර කිරීම

19. කිසිදු තැනැත්තකු විසින් යම් හදිසි අවස්ථා නියෝගයක් මගින් හෝ ඒ යටතේ වෙනත් යම් තැනැත්තකු වෙත පවරනු ලැබූ හෝ පනවනු ලැබූ යම් බලයක් හෝ කාර්යයක් ක්‍රියාත්මක කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී ඒ වෙනත් යම් තැනැත්තාට විරෝධය පෑම හෝ අවහිර කිරීම නොකළ යුතුය.

මාර්ග, දුම්රිය මාර්ග ආදියට බාධා කිරීම හෝ හානි කිරීම

20. කිසිදු තැනැත්තකු විසින්, නීත්‍යානුකූල අධිකාරි බලයකින් තොරව, යම් පොදු මාර්ගයකට, පාලමකට, පොදු මාර්ගයක බෝක්කුවකට යම් දුම්රිය මාර්ගයකට හෝ යම් පොදු ප්‍රවාහනයේ යෙදෙන වාහනයකට බාධාවක් හෝ හානියක් සිදු කරනු නොලැබිය යුතු ය.

වැරදි කිරීමට තැත් කිරීම

21. යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වන වරදක් සිදු කිරීමට-

(අ) තැත්කරන හෝ සිදු කිරීමට සූදානම් වීමේ යම් ක්‍රියාවක් කරන; හෝ

(ආ) අන් තැනැත්තකුට ආධාර හෝ අනුබල දෙන; හෝ

(ඇ) අන් තැනැත්තකු සමග කුමන්ත්‍රණය කරන,

යම් තැනැත්තකු ඒ වරදට වරදකරු විය යුතු අතර, ඒ අනුව ඒ වරද සඳහා එම හදිසි අවස්ථා නියෝගය යටතේ නියම කරනු ලැබ ඇති ආකාරයට නඩු විභාගයකට භාජනය කර එම හදිසි අවස්ථා නියෝගය යටතේ ඒ වරදට නියමිත දඬුවමෙන් ම ඔහුට දඬුවම් කළයුතුය.

22. යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වෙනත් යම් තැනැත්තකු වරදකරු බව දන්නා හෝ විශ්වාස කිරීමට යුක්ති සහගත හේතු ඇති කිසිදු තැනැත්තකු විසින් එකී වරද සඳහා එමතැනැත්තා අල්ලාගැනීම, ඔහුට විරුද්ධව නඩු විභාග කිරීම හෝ ඔහුට දඬුවම් දීම වැළැක්වීමේ, ඊට බාධා කිරීමේ හෝ මැදිහත්වීමේ අදහසින් ඒ තැන්ත්තාට කිසිදු සහායක් නොදිය යුතු ය. වරදකට සහාය දීම

23. යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වූ වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලැබූ අවස්ථාවක- පුද්ගල මණ්ඩල විසින් කරනු ලබන වැරදි

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් වේ නම්, ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකුම;සහ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් නම්, ඒ ව්‍යාපාර ආයතනයේ සෑම හවුල්කරුවකුම,

තමාගේ දැනුම නොමැතිව ඒ වරද කර ඇති බව හෝ ඒ වරද කිරීම වැළැක්වීමට නිසි උදෙ‍යා්ගයෙන් තමා ක්‍රියා කළ බව ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය.

24. (1) යම් තැනැත්තකු විසින් යම් හදිසි අවස්ථා නියෝගයක් හෝ එවැනි යම් නියෝගයක් යටතේ කරනු ලැබූ යම් නියමයක් හෝ සාදනු ලැබූ යම් රීතියක් හෝ එවැනි නියෝගයක් යටතේ දෙනු ලැබූ විධානයක් හෝ පනවනු ලැබූ යම් නියමයක් හෝ උල්ලංඝනය කරන්නේ නම් හෝ එවැන්නකට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින්නේ නම් ඔහු වරදකට වරදකරු විය යුතු අතර, ඒ නියෝගයෙහි සඳහන් යම් විශේෂ විධිවිධානවලට යටත්ව, මහාධිකරණය ඉදිරියේ ජූරි සභාවක් නොමැතිව පවත්වනු ලබන නඩු විභාගයකින් නැතහොත් මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාගයකින් පසු ඔහු වරදකරු කරනු ලැබූවිට, මාස තුනකට නොඅඩු වූද, අවුරුදු පහකට නොවැඩිවූ ද, බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් පන්සියයකට නොඅඩු වූ ද රුපියල් පන්දහසකට නොවැඩි වූ ද දඩයකට යටත් විය යුතුය. දණ්ඩන

(2) යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වූ වරදක් සඳහා ඒ නියෝගයෙහි දඬුවමක් නියම කර නොමැති අවස්ථාවක, ඒ වරද සම්බන්ධයෙන් වරදකරු වූ තැනැත්තකු මහාධිකරණය ඉදිරියේ ජූරි සභාවක් නොමැතිව පවත්වනු ලබන නඩු විභාගයකින් නැතහොත් මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, (1) වන ඡේදයෙහි නිශ්චිතව දක්වා ඇති දඬුවමටම ඔහු යටත් විය යුතු ය.

(3) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 306 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වරදකරු වූ තැනැත්තකුට අදාළ නොවිය යුතු ය.

## **VI** වන කොටස

### විමර්ශන, නඩු විභාග යනාදිය

25. (1) යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වූ වරදක් කිරීමට තැත්කිරීම පිළිබඳ චේතනාවක් හෝ සූදනමක් පිළිබඳව හෝ එවැනි වරදක් සිදු කිරීම පිළිබඳව හෝ දැන ගැනීමට ලැබෙන කවරකු වුව ද ඒ පිළිබඳ තොරතුරු වහාම ආසන්නතම ග්‍රාම නිලධරයාට හෝ ආසන්නතම පොලිස් ස්ථානයේ ස්ථානභාර නිලධරයාට ලබා දිය යුතු ය. තොරතුරු හෙළිදරව් කිරීමේ කාර්යය

(2) (1) වන ඡේදයෙහි සඳහන් තොරතුරු ලබාදීම ඕනෑකමින්ම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු ය.

(3) මේ නියෝග යටතේ යම් වරදක් සම්බන්ධයෙන් යම් තොරතුරක් ලද යම්ග්‍රාම නිලධරයකු විසින් වහාම ඒ තොරතුර ආසන්නතම පොලිස් ස්ථානයට ලබාදිය යුතුය.

විමර්ශනය කරන පොලිස් නිලධරයන් සතු බලතල

26. යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වරදක් පිළිබඳව විමර්ශනය කරන යම් පොලිස් නිලධරයකු විසින්-

(අ) වරදට සම්බන්ධ සිද්ධීන් හා අවස්ථානුගත කරුණු පිළිබඳ දැනුමක් ඇතැයි සැක කෙරෙන යම් තැනැත්තකුගෙන් වාචික ප්‍රශ්න අසනු ලැබිය හැකි අතර, එසේ ප්‍රශ්න කරන ලද තැනැත්තා විසින් කරන ලද යම් ප්‍රකාශයක් ලිඛිතව සටහන් කරගත යුතුය: එසේ වුවද,එම ප්‍රකාශය කරන තැනැත්තා විසින් මෙන්ම එය සටහන් කරන පොලිස් නිලධරයා විසින් ද, එම ප්‍රකාශයට අත්සන් තැබිය යුතුය: එසේම තවදුරටත්, එවැනි ප්‍රකාශයකට අත්සන් තැබීම යම් තැනැත්තකු විසින් ප්‍රතික්ෂේප කරන්නේ නම් එම ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව ඒ පොලිස් නිලධරයා විසින් වාර්තාගත කරනු ලැබිය යුතුය;

(ආ) ඒ තැනැත්තාගේ ආදර්ශ අත්අකුරු, ඡායාරූප, ඇඟිලි සටහන් සහ වෙනත් හඳුනාගැනීමේ ලක්ෂණ ලබා ගත හැකිය;

(ඇ) ඒ තැනැත්තා සෝදිසි කළහැකිය; නැතහොත් ඒ තැනැත්තා පදිංචි ගෙයට හෝ වැඩකරන ස්ථානයට ඇතුළු වී ඒ ගෙය හෝ ස්ථානය සෝදිසි කළහැකි ය;

(ඈ) එබඳු යම් වරදකට අදාළ හෝ සම්බන්ධ වූ නැතහොත් අදාළ යයි හෝ සම්බන්ධයයි සැකකෙරෙන යම් ස්ථානයකට, ගොඩනැගිල්ලකට, වාහනයකට හෝ යාත්‍රාවකට ඇතුළුවී එය සෝදිසිකළ හැකිය; තවද,

(ඉ) යම් විදුලි පණිවිඩයක්, තැපැල් ලේඛනයක් හෝ යම් බැංකුවක ඇති වෙනත් පොතක් හෝ ලේඛනයක් ඇතුළුව, කවරාකාරයක වූ හෝ යම් චංචල දේපළක් පරීක්ෂාකොට තම සන්තකයට ගත හැකි ය:

එසේ වුව ද, යම් බැංකුවකින් හෝ තැපැල් කාර්යාලයකින් යම් පොතක් හෝ ලේඛනයක් ලබාගැනීමට අදහස් කිරීමට පෙර, නිලයෙන් සහකාර පොලිස් අධිකාරීවරයකුගේ නිලයට අඩු නොවන නිලයක් දරන පොලිස් නිලධරයකු විසින් ඒ පොත හෝ ලේඛනය ඒ විමර්ශන කාර්යය සඳහා අවශ්‍ය වන බවට, අවස්ථාචෝචිත පරිදි, ඒ බැංකුවේ හෝ තැපැල් කාර්යාලයේ කළමනාකරු හෝ ස්ථානභාර නිලධරයා වෙත පූර්ව ලිඛිත තොරතුරු ඉදිරිපත් කළ යුතු ය.

සැකකරනු ලබනතැනැත්තන් සන්තකයෙහිතිබෙන ලේඛන

27. යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ යම් වරදකට සම්බන්ධ යයි සැක කෙරෙන තැනැත්තකුගේ සන්තකයේ, භාරයේ හෝ පාලනයේ තිබී සොයා ගනු ලබන යම් පොතක්, ලේඛනයක් හෝ පත්‍රිකාවක් ඒ වරද සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව කෙරෙන යම් නඩු කටයුතුවල දී අදාළවිය යුතු අතර, ඒ පොතේ, ලේඛනයේ හෝ පත්‍රිකාවේ අඩංගු කරුණු තවදුරටත් ඔප්පු කිරීමක් නොමැතිව ඒ තැනැත්තාට විරුද්ධව සාක්ෂි වශයෙන් පිළිගනු ලැබිය යුතුය.

ප්‍රශ්න කිරීමේ අයිතිය හා සහාය දීමේ කාර්යය

28. (1) වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වරදක් පිළිබඳව විමර්ශනය කරන පොලිස් නිලධරයකුට හෝ හදිසි අවස්ථා නියෝග යටතේ නිසි ලෙස බලය පවරනු ලැබූ තැනැත්තකුට-

(අ) යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ රඳවා ගනු ලැබ සිටින හෝ අත්අඩංගුවේ තබාගනු ලැබ සිටින තැනැත්තකු ඇතුළු යම්තැනැත්තකුගෙන් ප්‍රශ්න කිරීමේ අයිතිය සහ එසේ ප්‍රශ්න කරන කාලය තුළ දී ඒ විමර්ශනයේ කාර්යය සඳහා එම තැනැත්තා ස්ථානයකින් ස්ථානයකට රැගෙන යාමේඅයිතිය තිබිය යුතු ය; තව ද

(ආ) ඒ විමර්ශන කාර්යය සඳහා අවශ්‍යවන ලේඛනයක් ඇතුළුව යම් භාණ්ඩයක් හෝ වෙනත් දෙයක්, එසේ ප්‍රශ්න කරනු ලබන යම් තැනැත්තකුගේ භාරයෙන් තමාගේ භාරයට ගැනීමේ අයිතිය ද තිබිය යුතුය.

(2) යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේවූ වරදක් පිළිබඳව විමර්ශනය කරන පොලිස් නිලධරයකුට හෝ නිසි ලෙස බලය පවරනු ලැබූ වෙනත් තැනැත්තකුට සෑම සහයෝගයක් ම ලබා දීම සෑම තැනැත්තකුගේ ම කාර්යය විය යුතු අතර, (1)වන ඡේදයේ (අ) වන අනු ඡේදය යටතේ ප්‍රශ්න කරනු ලබන සෑම තැනැත්තෙක්ම ඔහුගෙන් අසනු ලබන සියලුම ප්‍රශ්නවලට සත්‍යවාදී ලෙස පිළිතුරු දිය යුතු ය. තව ද, වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් ව තිබුණද, එම තැනැත්තාට, එම තොරතුරු හෝ එම ලේඛනයේ අඩංගු කරුණු පිළිබඳ දැනුම ලැබී ඇත්තේ යම් තත්ත්වයක් නිසා ද එය නොසලකා, යම් ලේඛනයක අඩංගු කරුණු ඇතුළුව විමර්ශනයට විෂය වූ කරුණට අදළ සියලු තොරතුරු අනාවරණය කළයුතු ය.

(3) (1) වන ඡේදයේ (අ) වන අනුඡේදය යටතේ ප්‍රශ්න කරනු ලබන තැනැත්තකු භාරයේ හෝ සන්තකයේ ඇති ලේඛනයක් ඇතුළු යම් භාණ්ඩයක් හෝ වෙනත් දෙයක් යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වූ වරදක් පිළිබඳව විමර්ශනය කරන පොලිස් නිලධරයා වෙත හෝ නිසිලෙස බලය පවරනු ලැබූ තැනැත්තකු වෙත හෝ භාරදෙන ලෙස, ඒ පොලිස් නිලධරයා හෝ නිසිලෙස බලය පවරනු ලැබූ තැනැත්තා විසින් විධාන කරනු ලැබූවිට එසේ භාරදීම එසේ ප්‍රශ්න කරනු ලබන සෑම තැනැත්තකුගේම කාර්යය විය යුතුය.

(4) මේ නියෝගයේ විධිවිධාන උල්ලංඝනය කරන හෝ ඒ යටතේ නියම කරන ලද යම් කාර්යයක් කඩ කරන යම් තැනැත්තකු මේ නියෝගවල 24 වන නියෝගය යටතේ වරදක් සිදු කරනු ලබන්නේ ය.

29. යම් තැනැත්තකු රඳවාගෙන හෝ අත්අඩංගුවේ තබාගෙන ඇති කාලසීමාව තුළ ඒ විමර්ශනයේ කාර්යය සඳහා සාධාරණ කාලවේලාවන්හිදී ඒ තැනැත්තා වෙත ප්‍රවේශ වීමේ අයිතිය යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වරදක් පිළිබඳව විමර්ශනය කරන පොලිස් නිලධරයකු සතු විය යුතුය. ප්‍රවේශවීමේ අයිතිවාසිකම පොලිස් නිලධරයකු සතු බව

30. යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ පොලිස් නිලධරයකු සතු බලතල, වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ ඔහු සතු බලතලවලට අතිරේකව මිස, එමගින් එකී බලතල හීන කිරීමක් සිදු නොවිය යුතුය. පොලිස් නිලධරයන්ගේ බලතල වෙනත් බලතලවලට අතිරේකව වන බව

31. හදිසි අවස්ථා නියෝග යටතේ යම් තැනැත්තෙකු විසින් කරනු ලැබී යයි කියනු ලබන වරදක් සම්බන්ධයෙන් යම් අධිකරණයක පැවැත්වෙන යම් නීති කෘත්‍යයක්, ඒ අධිකරණයේ වෙනත් යම් කටයුතුවලට පෙර විභාග කරනු ලැබිය යුතු ය. අධිකරණ ඉදිරියේ නීති කෘත්‍ය සඳහා ප්‍රමුඛත්වය

32. (1) මෙහි අන්‍යාකාරයෙන් විධිවිධාන සලස්වා ඇත්නම් මිස සහ වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇතද, යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ යම් තැනැත්තකු විසින් කර ඇතැයි කියනු ලබන වරදක් පිළිබඳ නීති කෘත්‍ය තත් කාලයෙහි ඒතැනැත්තා සිටින ස්ථානය කෙරෙහි අධිකරණ බලය ඇති ශ්‍රී ලංකාවේ නිසි අධිකරණය ඉදිරියෙහි විභාග කරනු ලැබිය හැකිය. පරීක්ෂණ සහ නඩු විභාග

(2) (අ) හදිසි අවස්ථා නියෝග යටතේ තැනැත්තන් විසින් කර ඇතැයි කියනු ලබන වැරදි ; හෝ

(ආ) ඒ නියෝගය යටතේ, සෘජුව හෝ වක්‍රව යම් බලයක් පාවිච්චි කිරීම හෝ ක්‍රියාත්මක කිරීම හෝ කාර්යයක් කිරීම නැතහොත් උද්දේශිත ක්‍රියාත්මක කිරීම හෝ කිරීම හෝ හේතු කොටගෙන හෝ එයින් උද්ගතවූ නැතහොත් ඒ ක්‍රියාත්මක කිරීමේදී හෝ කිරීමේදී කරන ලද හෝ නොකර හරින ලද ක්‍රියාවලින් වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ යම් වැරදි සංයුක්ත වේ ද යම් තැනැත්තන් විසින් කරන ලදැයි කියනු ලබන එවැනි වැරදි, පිළිබඳ පරීක්ෂණ යම් අධිකරණයක දී පවත්වා නඩු විභාග කරනු ලැබිය යුතු බවට නීතිපතිවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි ය. ඒ අධිකරණයේ ප්‍රාදේශීය අධිකරණ බල සීමාව ඇතුළත දී ඒ වරදවල් කරනු ලැබුයේ නම්, එම අධිකරණ ඒ සඳහා අධිකරණ බලය සහිත අධිකරණ විය යුත්තේ ය.

(3) යටත් පිරිසෙයින් චෝදනාවලින් එකක්වත් ඉහත (2) වන ඡේදයේ (ආ) අනුඡේදයේ සඳහන් යම් වරදක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇත ද, නීතිපතිවරයා ට ඍජුවම මහාධිකරණය වෙත අධිචෝදනා පත්‍රයක් ඉදිරිපත් කළ හැකි වන අතර, එසේ විත්තිකරුට විරුද්ධව ඉදිරිපත් කෙරෙන අධිචෝදනා පත්‍රය සම්බන්ධ නඩු විභාගය ජූරි සභාවක් නොමැතිව විභාග කරනු ලැබිය යුතු ය.

(4) (2) වන ඡේදය යටතේ යම් වරදක් ගැන පරීක්ෂණ පවත්වා නඩුව විභාග කළ යුතු වන්නේ කුමන අධිකරණයක් මගින් දැයි නීතිපතිවරයා තීරණය කළ අවස්ථාවක, ඒ වරද ගැන පරීක්ෂණ පවත්වා නඩුව විභාග කළ යුතු අධිකරණය ලෙස ඔහු විසින් ලිඛිත නියෝගයක් මගින් ඒ අධිකරණය නම් කළ යුතු අතර, ඒ අනුව ඒ අධිකරණය විසින් ඒ නියෝගයේ බලය ප්‍රකාර පරීක්ෂණය හෝ නඩු විභාගය පවත්වා ඒ නියෝගය ඒ පරීක්ෂණයේ හෝ නඩු විභාගයේ නීති කෘත්‍ය වාර්තා සමග ගොනු කොට තැබිය යුතුය.

(5) (2) වන ඡේදය යටතේ නීතිපතිවරයා විසින් කරනු ලබන යම් තීරණයක් පහත සඳහන් වැරදිවලට අදාළ කරගනු ලැබිය හැකිය:-

(අ) හදිසි අවස්ථා නියෝග යටතේ යම් තැනැත්තන් විසින් ශ්‍රී ලංකාව මුළුල්ලෙහිම හෝ ශ්‍රී ලංකාවේ යම් නිශ්චිත ප්‍රදේශයක කරන ලදැයි කියනු ලබන වැරදි ; හෝ

(ආ) යම් නිශ්චිත ප්‍රභේදයකට හෝ විස්තරයකට අයත් තැනැත්තන් විසින් ශ්‍රී ලංකාවේ යම් නිශ්චිත ප්‍රදේශයක කරන ලදැයි කියනු ලබන වැරදි ; හෝ

(ඇ) යම් තැනැත්තන් විසින් ශ්‍රී ලංකාව මුළුල්ලෙහි ම හෝ ශ්‍රී ලංකාවේ යම් නිශ්චිත ප්‍රදේශයක කරන ලදැයි කියනු ලබන යම් නිශ්චිත ප්‍රභේදයකට හෝ විස්තරයකට අයත් සියලු ම වැරදි ; හෝ

(ඈ) යම් නිශ්චිත ප්‍රභේදයකට හෝ විස්තරයකට අයත් තැනැත්තන් විසින් හෝ යම් නිශ්චිත තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව මුළුල්ලෙහි ම හෝ ශ්‍රී ලංකාවේ යම් නිශ්චිත ප්‍රදේශයක කර ඇතැයි කියනු ලබන යම් නිශ්චිත ප්‍රභේදයකට හෝ විස්තරයකට අයත් සියලුම වැරදි ; හෝ

(ඉ) යම් නිශ්චිත තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව මුළුල්ලෙහිම හෝ ශ්‍රී ලංකාවේ යම් නිශ්චිත ප්‍රදේශයක කර ඇතැයි කියනු ලබන යම් නිශ්චිත වරදක්.

(6) මෙම නියෝගය අඛණ්ඩව බලාත්මකව පවතින කාලය තුළ යම් අපරාධ වරදක්, යම් අධිකරණයකින් හෝ ස්ථානයකින් වෙනත් අධිකරණයකට හෝ ස්ථානයකට මාරු කර විමර්ශනය කිරීම සඳහා (හෝ විභාග කිරීම සඳහා) නීතිපතිවරයාට බලය ලබාදෙන 1978 අංක2 දරන අධිකරණ සංවිධාන පනතේ 47 වන වගන්තිය, එම වගන්තියේ (2) වන උප වගන්තිය බලාත්මකව නොපැවති ලෙස බලාත්මක විය යුතු ය.

නීතිපතිවරයාගේ අනුමතය.

33. (1) 12 වන නියෝගයේ (3) වන ඡේදයේ විධිවිධානවලට යටත්ව නිතිපතිවරයාගේ ලිඛිත අනුමතය මගින් හෝ ලිඛිත අනුමතය ඇතිව මිස -

(අ) යම් හදිසි අවස්ථා නියෝගයකට එරෙහි වරදක් සම්බන්ධයෙන් ; හෝ

(ආ) ඒ නියෝගය යටතේ යම් බලයක් හෝ කාර්යයක් ඍජුව හෝ වක්‍රව ක්‍රියාත්මක කිරීමේ දී හෝ කිරීමේ දී හෝ උද්දේශිත ක්‍රියාත්මක කරවීමේ දී හෝ කිරීමේ දී, කිරීමෙන් හෝ නොකර හැරීමෙන් උද්ගතවූ නැතහොත් ඇතිවූ හෝ වරදකින් සංයුක්ත වන ක්‍රියාව හෝ නොකර හැරීම වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ තැනැත්තන් විසින් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන වරදක් සම්බන්ධයෙන්; හෝ මහෙස්ත්‍රාත් අධිකරණයක කිසිම නඩු පැවරීමක්, සිදු කරනු නොලැබිය යුතු ය.

(2) නියමයෙහි නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් හදිසි අවස්ථා නියෝගයකට විරුද්ධව යම් වරදක් සම්බන්ධයෙන් මේ නියෝගයේ (1) වන ඡේදයෙහි විධිවිධාන අදාළ නොවිය යුතුයයි ජනාධිපතිවරයා විසින් නියමයක් මගින් ප්‍රකාශකරනු ලැබිය හැකිය. තවද, එවැනි නියමයක් බලපවත්වනතාක් එවැනි වරදකට ඒ ඡේදය අදාළ නොවිය යුතු ය.

මහාධිකරණ ඉදිරියේ නඩු විභාග.

34. (1) යම් හදිසි අවස්ථා නියෝගයක හෝ වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, හදිසි අවස්ථා නියෝග යටතේ යම් වරදක් සම්බන්ධයෙන් විශේෂ අධිකරණ විභාගයක් ඇතුළුව නඩු විභාගය, නීතිපතිවරයා විසින් අධිචෝදනා පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබීම මත පවත්වනු ලැබිය හැකි අතර, එවිට චෝදනාවකට ලක්වූ තැනැත්තාට විරුද්ධව, අවස්ථාවෝචිත පරිදි, ජූරි සභාවක් නොමැතිව මහාධිකරණයේ විශේෂ අධිකරණයක් ඉදිරියේ මූලික පරීක්ෂණයක් නොමැතිව නඩු විභාග කරනු ලැබිය යුතු ය.

එසේ වුව ද, මූලික පරීක්ෂණයක දී වාර්තාගත කරනු ලැබූ සාක්ෂි, අධිචෝදනාවක් සකස් කිරීම සඳහා අවශ්‍ය බව නීතිපතිවරයාගේ මතය වන අවස්ථාවක, මූලික පරීක්ෂණයක් පැවැත්වීම සඳහා ඔහු විසින් විධාන කරනු ලැබිය හැකිය. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XV වන පරිච්ඡේදයේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ මූලික පරීක්ෂණයට අදාළ කරගනු ලැබිය යුතුය.

(2) එම නියෝග ප්‍රකාරව වරදක් සිදුකරන ලද බවට සැක කරන ලද හෝ චෝදනා ලද කිසිදු තැනැත්තකු සුවිශේෂී අවස්ථාවන් යටතේ හැර ඇප ලබාදීම සඳහා පිළි නොගත යුතු ය.

(3) මේ නියෝග යටතේ මහාධිකරණයේ විශේෂ අධිකරණයක් ඇතුළුව මහාධිකරණය ඉදිරියෙහිවූ නඩු විභාගයක්, අවස්ථාවෝචිත පරිදි, ජූරි සභාවක් නොමැතිව මහාධිකරණය ඉදිරියෙහි, හෝ මහාධිකරණයේ විශේෂ අධිකරණයක් ඉදිරියෙහි නඩු විභාග සම්බන්ධයෙන් වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට හැකිතාක් ඉක්මනින් පැවත්විය යුතුය.

35. හදිසි අවස්ථා නියෝග යටතේ පවත්වනු ලබන යම් විමර්ශනවලට 1979 අංක 15 දරන අපරාධනඩු විධාන සංග්‍රහය පනතේ XI වන පරිච්ඡේදයේ විධිවිධාන අදාළ නොවිය යුතුය.

1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XI වන පරිච්ඡේදයේ විධිවිධාන අදාළ නොවිය යුතු බව.

VII වන කොටස

විවිධ

36. (1) මේ නියෝගය අඛණ්ඩව බලපවත්නා කාලය තුළ සැරයන් නිලයට නො අඩු නිලයක සිටින යම් පොලිස් නිලධරයකු විසින් හෝ කෝප්‍රල් නිලයට නොඅඩු තත්ත්වයක සිටින ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ යම් සාමාජිකයකු විසින් හෝ ප්‍රධාන නැවියකුට නොඅඩු තත්ත්වයක සිටින ශ්‍රී ලංකා නාවික හමුදාවේ යම් සාමාජිකයකු විසින් හෝ කෝප්‍රල් නිලයට නොඅඩු තත්ත්වයක සිටින ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ යම් සාමාජිකයකු විසින් හෝ යම් පොදු මාර්ගයක, දුම්රිය මාර්ගයක, පොදු පිට්ටනියක, පොදු විනෝද ක්‍රීඩා භූමියක හෝ වෙනත් පොදු භූමියක,මුහුදු වෙරළක හෝ යම් ප්‍රසිද්ධ ගොඩනැගිල්ලක් හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් අසළ හෝ එහි භූමියෙහි සිටින යම් තැනැත්තකුට හෝ තැනැත්තන්ට ඒ ස්ථානයෙන් ඉවත් වීමට අණ කළ හැකිය. තව ද, ඒ නියමය පිළිපැදීම, අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තාගේ හෝ ඒ එක් එක් තැනැත්තාගේ යුතුකම විය යුතු ය.

විවිධ බලතල.

(2) මේ නියෝගයෙහි (1) වන ඡේදය යටතේ නියමයක් නිකුත් කිරීමට බලය පවරනු ලැබූ යම් නිලධරයකු විසින් නියමයක් නිකුත් කරනු ලැබූ අවස්ථාවක දී, යම් තැනැත්තකු ඒ නියමයට අනුකූලව ක්‍රියා නොකරන්නේ නම් හෝ එම නියමයට අනුකූලව ක්‍රියා නොකිරීමේ අධිෂ්ඨානයක් පෙන්වන ආකාරයට හැසිරෙන්නේ නම් ඒ නිලධරයා විසින් අවශ්‍ය විය හැකි යම් සහායක් ඇතිව, සන්නද්ධ බලය ඇතුළු බලයෙන් ඒ නියමය ක්‍රියාත්මක කිරීමට කටයුතු ආරම්භ කළ හැකි අතර, ඒ තැනැත්තා ඉවත් කිරීමට හෝ සිරභාරයට ගෙන රඳවා තැබීමට කටයුතු සලස්වනු ලැබිය හැකි ය.

(3) මේ නියෝගය අඛණ්ඩව බලපවත්නා කාලය තුළ 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 306(1), (2) සහ (4) වන වගන්ති, වෙනත් යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබූ හෝ වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකුට හෝ එවැනි තැනැත්තකු සම්බන්ධයෙන් අදාළ නොවිය යුතුය.

37. (1) වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුවද, යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ සිරභාරයට ගෙන රඳවා තබාගනු ලැබූ යම් තැනැත්තකු, එසේ සිරභාරයට ගෙන රඳවා තබාගෙන ඇති කාලසීමාව ඇතුළත පොලිස් නිලධරයකු විසින් හෝ යුද්ධ හමුදාපති, නාවිකහමුදාපති හෝ ගුවන් හමුදාපති විසින් බලය දෙනු ලැබූ අන්කිසි නිලධරයකු විසින් හෝ ප්‍රශ්න කරනු ලැබිය හැකිය. තවද තමාගෙන් අසනු ලැබූ ප්‍රශ්නයට පිළිතුරුදීම එසේ ප්‍රශ්න කරනු ලැබූ තැනැත්තාගේ වගකීම වන්නේ ය.

ප්‍රශ්නවලට පිළිතුරුදීමට ඇති යුතුකම.

(2) (1) වන ඡේදය යටතේ සිරභාරයට ගෙන රඳවා ගෙන ඇති යම් තැනැත්තකුගෙන් ප්‍රශ්න කිරීමේ කාර්යය සඳහා හෝ ඒ ප්‍රශ්න කිරීමට සම්බන්ධ වෙනත් යම් කාර්යයක් සඳහා ඒ තැනැත්තා (1) වන ඡේදයේ සඳහන් යම් නිලධරයකු විසින් ඔහු රඳවාගෙන හෝ සිරභාරයේ තබා ගෙන ඇති යම් ස්ථානයකින් ඉවත් කොට එක් වරකට දින හතකට නොවැඩි කාලයක් සඳහා එම නිලධරයාගේ තාවකාලික අත් අඩංගුවේ තබා ගත හැකිය.

38. (1) මේ නියෝගවල ඇතුළත් යම් විශේෂ විධිවිධානවලට අගතියක් නොමැතිව, නිසි බලධරයා විසින් හෝ ඔහු වෙනුවෙන් ඉල්ලීමක් ඉදිරිපත් කිරීමේ දී, රාජ්‍ය ආරක්ෂාව සඳහා හෝ මහජන සාමය පවත්වාගෙන යාම සඳහා

තොරතුරු ලබාගැනීම හෝ

භාණ්ඩ පරීක්ෂා කිරීමේ බලය.

හෝ යම් හදිසි අවස්ථා නියෝගයක කාර්යය සඳහා හෝ ලබා ගැනීමට හෝ පරීක්ෂා කරනු ලැබීමට අවශ්‍යයයි නැතහොත් යෝග්‍ය යයි නිසි බලධරයා හෝ ඉල්ලීම කරනු ලබන තැනැත්තා විසින් හෝ අදහස් කරන්නාවූ ද, තමාගේ සන්තකයේ පවතින යම් තොරතුරු හෝ භාණ්ඩයක් ඉල්ලීමෙහි නිශ්චිතව සඳහන් නිසි බලධරයා හෝ තැනැත්තාට ඉහතකී තැනැත්තා විසින් සැපයිය යුතුය. නැතහොත් ඉදිරිපත් කළ යුතුය. තව ද මේ නියෝගය යටතේ යථා පරිදි ඔහු වෙත කරනු ලැබූ ඉල්ලීමක් ප්‍රකාර, යම් තොරතුරක් හෝ තම සන්තකයෙහි ඇති භාණ්ඩයක් සැපයුම හෝ ඉදිරිපත් කිරීම යම් තැනැත්තකු විසින් පැහැර හැරියහොත් එවැනි තැනැත්තකු වරදකට වරදකරු වන්නේ ය.

(2) මේ නියෝගයෙහි "භාණ්ඩය" යන්නට යම් පොතක්, ගිණුමක් හෝ ලේඛනයක් ඇතුළත් වේ.

මෝටර් වාහන පනතේ ඇතැම් විධිවිධානවලින් සන්නද්ධ හමුදවල සාමාජිකයන් නිදහස් කිරීම.

39. මහජන සාමය ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා යම් මෝටර් වාහනයක් පදවන ලෙස නිසි බලධරයා විසින් බලය පවරනු ලැබ, සන්නද්ධ හමුදා සාමාජිකයකු යම් මෝටර් වාහනයක් එසේ පදවනු ලබන අවස්ථාවක දී, 1955 ජූලි මස 8 වන දින අංක 10,815 දරන ගැසට් පත්‍රයෙහි පළකරන ලද 1955 මෝටර් වාහන (මහ රැජිනගේ හමුදා නිදහස් කිරීමේ) නියෝගවල 'අ' උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් මෝටර් වාහන පනතේ හා ඒ යටතේ සාදන ලද නියෝගවල විධිවිධානවලින් එම සන්නද්ධ හමුදා සාමාජිකයා නිදහස් වන්නේය.

දිසාපතිවරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය.

40. (1) ජනාධිපතිවරයා විසින්, නියමයක් මගින් එම නියමයේ නිශ්චිතව දක්වනු ලබන ශ්‍රී ලංකාවේ යම් ප්‍රදේශයක් සඳහා නමින් හෝ ධුරයෙන් සම්බන්ධීකරණ නිලධරයා වශයෙන් යම් තැනැත්තකු පත්කරනු ලැබිය හැකි ය.

(2) ශ්‍රී ලංකාවේ යම් ප්‍රදේශයක් සඳහා නියමයක් මගින් ජනාධිපතිවරයා විසින් සම්බන්ධීකරණ නිලධරයකු පත්කර ඇති අවස්ථාවක දී, යම් ලිඛිත නීතියක් මගින් හෝ අන්‍යාකාරයකින් දිසාපතිවරයකු වෙත පවරා ඇති හෝ පනවා ඇති සියලු බලතල, කාර්ය හා කර්තව්‍ය එම ප්‍රදේශය තුළ දී එම නිලධරයා විසින් ක්‍රියාත්මක කිරීම, කිරීම හා ඉටු කිරීම කරනු ලැබිය යුතු අතර, එම කාර්ය සඳහා එම ප්‍රදේශය සම්බන්ධයෙන් වන අදාල වීමක දී එවැනි සෑම සඳහන් කිරීමක් ම එම සම්බන්ධීකරණ නිලධරයා සම්බන්ධයෙන් කරනු ලබන සඳහන් කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) නියමයේ නිශ්චිතව දක්වා ඇති එවැනි යම් ප්‍රදේශයක් සඳහා (1) වන ජේදය යටතේ පත්කර ඇති සම්බන්ධීකරණ නිලධරයකු පිළිබඳව අධීක්ෂණය කිරීම සඳහා ජනාධිපතිවරයා විසින් නියමයක් මගින් නමින් හෝ ධූරයෙන් ප්‍රධාන සම්බන්ධීකරණ නිලධරයකු පත් කරනු ලැබිය හැකි ය.

(4) මේ නියෝගය යටතේ ස්වකීය කාර්යය ඉටු කිරීම සඳහා ප්‍රධාන සම්බන්ධීකරණ නිලධරයාට සහාය වීමට අවශ්‍ය විය හැකි යම් නියෝජ්‍ය ප්‍රධාන සම්බන්ධීකරණ නිලධරයන් සංඛ්‍යාවක් ජනාධිපතිවරයා විසින් නමින් හෝ ධූරයෙන් පත්කරනු ලැබිය හැකි ය.

(5) මේ නියෝගය යටතේ එම ප්‍රධාන සම්බන්ධීකරණ නිලධරයා වෙත පවරා ඇති හෝ පනවා ඇති හෝ වෙන් කර දි ඇති බලතල කාර්ය සහ කර්තව්‍ය ප්‍රධාන සම්බන්ධීකරණ නිලධරයා විසින් (4) වන ජේදය යටතේ පත්කරන ලද යම් නියෝජ්‍ය ප්‍රධාන සම්බන්ධීකරණ නිලධරයකු වෙත පවරනු ලැබිය හැකි ය.

(6) (3) වන ජේදය යටතේ පත්කරන ලද යම් ප්‍රධාන සම්බන්ධීකරණ නිලධරයකු විසින්, (4) වන ජේදය යටතේ පත් කරන ලද හෝ තමා වෙත (5) වන ජේදය යටතේ ප්‍රධාන සම්බන්ධීකරණ නිලධරයකුගේ බලතල පවරා ඇති නියෝජ්‍ය ප්‍රධාන සම්බන්ධීකරණ නිලධරයකු විසින් -

(අ) මේ නියෝග මගින් යම් සම්බන්ධීකරණ නිලධරයකු වෙත පවරා හෝ පනවා ඇති සහ එම නිලධරයා විසින් අධීක්ෂණ කාර්ය ඉටුකරනු ලබනුයේ යම් නිලධරයකු කෙරෙහි ද එම නිලධරයා විසින් තමා වෙත පවරා හෝ පනවා හෝ ඇති බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම , කිරීම හෝ ඉටු කිරීම කරනු ලැබිය හැකි ය.

(ආ) මේ නියෝග මගින් එවැනි සම්බන්ධීකරණ නිලධරයකු වෙත පවරා හෝ පනවා ඇති යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය එම සම්බන්ධීකරණ නිලධරයා විසින් ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම අධීක්ෂණය කරන සම්බන්ධීකරණ නිලධරයා වෙත යම් විශේෂ හෝ සාමාන්‍ය විධාන ලබා දිය හැකි ය.

රජයේ සේවකයන් ආදීන්ගේ වගකීම්

41. මේ නියෝගවල සඳහන් විධිවිධාන සද්භාවයෙන් යුතුව, අපක්ෂපාතී ලෙස සහ පරිපූර්ණ ලෙස බලාත්මක කිරීම සඳහා සද්භාවයෙන් පියවර ගැනීම සහ ස්වකීය උපරිම හැකියාව අනුව මෙහි අන්තර්ගත නියෝග උල්ලංඝණය වීම වැළැක්වීම සඳහා පියවර ගැනීම සියළු රාජ්‍ය සේවකයන්ගේ, පොලිස් නිලධරයන්ගේ, සන්නද්ධ හමුදා නිලධරයන්ගේ හා ව්‍යවස්ථාපිත මණ්ඩල වල සහ අධිකාරීන්ගේ සේවා නියුක්තිකයන්ගේ වගකිම වන්නේ ය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.